# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2003 අංක 7 දරන එකතුකළ අගය මත බදු (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2003 පෙබරවාරි මස 27 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2003 පෙබරවාරි මස 28 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 16.25 යි. තැපැල් ගාස්තුව : රු. 6.75 යි.

**2003 අංක 7 දරන එකතුකළ අගය මත බදු (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 2003 පෙබරවාරි මස 27 වන දින]

එල්. ඩී.—ඕ. 89/2002

**2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

1. මේ පනත 2003 අංක 7 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 2 වන වගන්තියේ (3) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :- 2002 අංක 14 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ උපවගන්තියේ පළමුවන අතුරු විධානයේ-

(අ) (ආ) ඡේදයේ "අපනයනය කරනු ලබන රෙදිවලට සහ ආනයනය කිරීම සඳහා" යන වචන වෙනුවට "ආනයනය කරනු ලබන රෙදිවලට සහ අපනයනය කිරීම සඳහා" ;

(ආ) (ඉ) ඡේදයේ "යම් නැවකට," යන වචන වෙනුවට "2002 දෙසැම්බර් 31 වන දින හෝ ඊට පෙර ආනයනය කරන ලද යම් නැවකට," යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(2) ඒ උපවගන්තියේ දෙවන අතුරු විධානයේ-

(අ) (අ) ඡේදයේ (ii) වන අනුඡේදයේ "(6) වන උපවගන්තියේ සඳහන්" යන වචන සහ ඉලක්කම වෙනුවට "(7) වන උපවගන්තියේ සඳහන්" යන වචන සහ ඉලක්කම ආදේශ කිරීමෙන් ;

(ආ) "එසේ ආනයනය කරන" යන වචනවල සිට එම අතුරු විධානයේ අවසානය දක්වා වූ කොටස වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—.

"(ඇ) 2003 ජනවාරි 01 වන දින හෝ ඉන්පසුව ආනයනය කරන යම් නැවක් සඳහා බදු මුදල් ගෙවීම එම ආනයනය කළ දිනයේ සිට මාස තිස් හයක කාලසීමාවක් සඳහා විලම්භනය කරනු ලැබිය හැකි ය. එසේ විලම්භනය කළ මුදල් ප්‍රමාණය, එකී මාස තිස්හයක කාලය ඉකුත් වීමට ප්‍රථම, ත්‍රෛමාසික වාරික වලින් ගෙවා බේරුම් කළ යුතුය."

බදු මුදල් ගෙවීම විලම්භනය කිරීම, එසේ ආනයනය කරන, ලැබෙන හෝ මිල දී ගත් භාණ්ඩ සඳහා අයවිය යුතු බදු මුදල ආවරණය වන බැංකු ඇපකරයක් හෝ සමාගම් ඇපකරයක් සැපයීමට යටත්ව විය යුතු ය. (ආ) ඡේදය යටතේ කරන විලම්භනය කිරීම් සම්බන්ධයෙන් වන විට, එම භාණ්ඩ ආනයනය කළ දිනයේ සිට එක් මාසයක් ඇතුළත නැවත අපනයනය කිරීම සඳහා ආණ්ඩුවේ ආයතනයක් විසින් ආනයනය කර ඇති අවස්ථාවක, ඇපකරයක් අවශ්‍ය නොවිය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කිරීම.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය එහි (1) වන උපවගන්තියේ අතුරු විධානයේ "77 වන වගන්තියේ (2) වන උපවගන්තිය" යන වචන සහ ඉලක්කම් වෙනුවට "80 වන වගන්තියේ (2) වන උපවගන්තිය" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය සංශෝධනය කිරීම.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය, එහි (2) වන උපවගන්තියේ "77 වන වගන්තියේ (2) වන උපවගන්තිය" යන වචන සහ ඉලක්කම් වෙනුවට "80 වන වගන්තියේ (2) වන උපවගන්තිය" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනත යටතේ 2002 අගෝස්තු 01 වන දිනට පෙර නිකුත් කරන ලද වලංගු

බදු ඉන්වොයිස් පත්‍රයක්" යන වචන සහ ඉලක්කම් වෙනුවට "(1) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් කාලසීමාව ඇතුළත නිකුත් කරනු නොලැබුවා වූ ද, (2) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූල නොවන්නා වූ ද, බදු ඉන්වොයිස් පත්‍රයක්, වලංගු බදු ඉන්වොයිස් පත්‍රයක් නොවිය යුතු ය. 1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනත යටතේ 2002 අගෝස්තු 01 වන දිනට පෙර හෝ ඉන් පසුව නිකුත් කරන ලද වලංගු බදු ඉන්වොයිස් පත්‍රයක්," යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ "බදු ඉන්වොයිස් පත්‍රය ලෙස සැලකිය හැක." යන වචන වෙනුවට "මේ පනත යටතේ බදු ඉන්වොයිස් පත්‍රයක් වශයෙන් සලකනු ලැබිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ;

(3) ඒ වගන්තියේ (6) වන උපවගන්තියේ "බදු ඉන්වොයිස් පත්‍රයක් ලෙස සලකනු නොලැබිය යුතු ය" යන වචන වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන් :—

"………බදු ඉන්වොයිස් පත්‍රයක් වශයෙන් සලකනු නොලැබිය යුතු ය :

එසේ වුව ද, යම් ආණ්ඩුවේ ආයතනයකට, පළාත් සභාවකට, පළාත් පාලන ආයතනයකට හෝ යම් රාජ්‍ය සංස්ථාවකට එවැනි බදු අයකළ හැකි සැපයුමක් කරන ලියාපදිංචි තැනැත්තා විසින් අවස්ථාවෝචිත පරිදි, ඒ ආයතනය, සභාව, පළාත් පාලන ආයතනය හෝ සංස්ථාව මේ පනත යටතේ ලියාපදිංචි වී තිබුණද, නොතිබුණද, ඒ ආයතනයට, සභාවට, පළාත් පාලන ආයතනයට හෝ සංස්ථාවට කරන ලද සැපයුම වෙනුවෙන් බදු ඉන්වොයිස් පත්‍රයක් නිකුත් කරනු ලැබිය යුතු ය.".

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය, එහි (12) වන උපවගන්තියේ "(9) වන උපවගන්තියේ" යන වචන සහ ඉලක්කම වෙනුවට "(10) වන උපවගන්තියේ" යන වචන සහ ඉලක්කම ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය සංශෝධනය කිරීම.

ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කිරීම.

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය, මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ වගන්තියේ "(1) වන උපවගන්තියේ අතුරු විධානයේ "ඇඟළුම් සැපයීම මත" යන වචන වෙනුවට "ඇඟළුම් සැපයීම මත හෝ රේගු දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ, අපනයනය සඳහා ඇඟළුම් නිෂ්පාදනය කරන වෙනත් යම් ඇඟළුම් නිෂ්පාදකයකු විසින් කරන ඇඟළුම් සැපයීම මත" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ අතුරු විධානයට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන් :-

"තවදුරටත් එසේ වුව ද, එවැනි ඇඟළුම් විකිණීමක් මත මීට පූර්ව අතුරු විධානයේ නිශ්චය කොට දැක්වෙන මුදල් ප්‍රමාණය ගෙවා තිබෙන අවස්ථාවක, ඒ ඇඟළුම් විකිණීම මත, රේගු ආඥාපනත යටතේ යම් තීරු බද්දක් ද ඇතුළුව වෙනත් කිසි බද්දක් හෝ ගාස්තුවක් අයකිරීම හෝ එකතු කිරීම කරනු නොලැබිය යුතු ය.

(3) ඒ වගන්තියේ (5) වන උපවගන්තිය-

(අ) ඒ උපවගන්තියේ පළමුවන අතුරු විධානයේ (ආ) ඡේදයේ, "(6) වන උපවගන්තියේ" යන වචන හා ඉලක්කම වෙනුවට "(7) වන උපවගන්තියේ" යන වචන හා ඉලක්කම ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ උපවගන්තියේ දෙවන අතුරු විධානයේ "ආපසු නොගෙවිය යුතු ය." යන වචන වෙනුවට "ආපසු නොගෙවිය යුතු ය. එහෙත් 1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනත යටතේ 2002 ජූලි 31 වන දිනට පවත්නා යම් එබඳු යෙදවුම් බදු අතිරික්තයක් ඇතුළුව, එම යෙදවුම් බදු, ඉදිරියට ගෙන යා යුතු ය." යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(4) (අ) ඒ වගන්තියේ (6) වන උපවගන්තියේ (iii) වන හා (iv) වන ඡේද ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන් :—

"(iii) ලබාගත් භාණ්ඩ හෝ සේවා සැපයුම-

(අ) වලංගු බදු ඉන්වොයිස් පත්‍රයක් මගින් ; හෝ

(ආ) රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මේ පනත යටතේ හෝ 1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනත යටතේ හෝ නිකුත් කරන ලද රේගු භාණ්ඩ ප්‍රකාශනයක් හෝ වෙනත් සහතික කළ ලේඛනයක් මගින්,

සනාථ කර අවස්ථාවෝචිත පරිදි, ඒ බදු ඉන්වොයිස් පත්‍රය නිකුත් කරන ලද්දේ යම් බදු අය කළහැකි කාලසීමාවක් වෙනුවෙන් ද, ඒ අදාළ කාලසීමාව අවසානයේ සිට හෝ භාණ්ඩ ආනයනය කරනු ලැබූ දින සිට මාස දොළහක් ඇතුළත ලැබී නැත්නම් ;

(iv) අවස්ථාවෝචිත පරිදි, ඒ බදු ඉන්වොයිස් පත්‍රය මත හෝ රේගු භාණ්ඩ ප්‍රකාශනය මත වූ යෙදවුම් බද්ද, ඒ බදු ඉන්වොයිස් පත්‍රය හෝ රේගු භාණ්ඩ ප්‍රකාශනය ලැබුණු බදු අය කළ හැකි කාලසීමාවේ අවසන් දිනයේ සිට මාස හයක් ඉකුත් වීමට පෙර අවසන් වන යම් බදු අයකළ හැකි කාලසීමාවක නිමැවුම් බද්දෙන් අඩුකර ගෙන නොමැති නම්,"

(ආ) ඒ වගන්තියේ (6) වන උපවගන්තියේ පළමුවන අතුරු විධානයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අතුරු විධානය ඇතුළත් කිරීමෙන්-

"තවදුරටත් එසේ වුවද, (1) වන අනුඡේදයේ සඳහන් යම් මෝටර් වාහනයක් සම්බන්ධයෙන් ඉඩ දෙනු නොලැබූ ඒ වාහනය සම්පූර්ණයෙන්

හෝ අර්ධ වශයෙන් යම් බදු අය කළ හැකි ක්‍රියාකාරකමක් සඳහා යොදවන අවස්ථාවක, (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, ඉඩ දෙනු නොලැබූ යෙදවුම් බද්ද 2003 ජනවාරි 01 වන දින හෝ ඉන් පසු ආරම්භ වන යම් බදු අයකළ හැකි කාලසීමාවක් සඳහා වන එම යෙදවුම් බද්දෙන් සියයට පණහක සීමාවක් දක්වා ඉඩ දෙනු ලැබිය හැකි ය.";

(5) ඒ වගන්තියේ (7) වන උපවගන්තියේ "(5) වන උපවගන්තියේ" යන වචන හා ඉලක්කම වෙනුවට "(6) වන උපවගන්තියේ" යන වචන හා ඉලක්කම ආදේශ කිරීමෙන් ;

(6) ඒ වගන්තියේ (8) වන උපවගන්තියේ (ආ) ඡේදයේ "(6) වන උපවගන්තිය යටතේ" යන වචන හා ඉලක්කම වෙනුවට "(7) වන උපවගන්තිය යටතේ හෝ 1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනතේ 22 වන වගන්තියේ (6) වන උපවගන්තිය යටතේ" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ IIIඅ යන අලුත් පරිච්ඡේදය ඇතුළත් කිරීම.

**8.** මෙහි පහත දැක්වෙන අලුත් පරිච්ඡේදය III වන පරිච්ඡේදයට ඉක්බිතිව ම ඇතුළත් කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ IIIඅ පරිච්ඡේදය ලෙස බලාත්මක වන්නේ ය :-

"IIIඅ පරිච්ඡේදය

**නිශ්චිත ආයතන විසින් මූල්‍ය සේවා සැපයීම වෙනුවෙන්, එකතු කළ අගය මත බදු පැනවීම**

නිශ්චිත ආයතන විසින් කරන මූල්‍ය සේවා සැපයීම් වලින් එකතු කළ අගය මත බදු අය කිරීම.

25අ (1) මේ පනතේ I, II, III වන පරිච්ඡේදවල සහ මේ පනතේ පළමුවන උපලේඛනයේ (xi) අයිතමයේ කවර විධිවිධානයක් තිබුණ ද, ශ්‍රී ලංකාවෙහි මූල්‍ය සේවා සැපයීමේ ව්‍යාපාරය කරගෙන යන යම් නිශ්චිත ආයතනයක් විසින් කරනු ලබන ශ්‍රී ලංකාවෙහි මූල්‍ය සේවා සැපයීම්වලින්, 2003 ජනවාරි 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, මේ පරිච්ඡේදයේ

විධිවිධානවලට අනුකූලව, (මෙම පරිච්ඡේදයේ මින් මතු "බද්ද" යනුවෙන් සඳහන් කරනු ලබන) එකතු කළ අගය මත බද්දක් අය කරනු ලැබිය යුතු ය.

(2) ශ්‍රී ලංකාවෙහි මූල්‍ය සේවා සැපයීමේ ව්‍යාපාරය කරගෙන යන සෑම නිශ්චිත ආයතනයක් ම, ඒ එක් එක් නිශ්චිත ආයතනයක් විසින් සපයන මූල්‍ය සේවාවේ අගය, අවස්ථාවෝචිත පරිදි, මාස තුනක කාල සීමාවක් සඳහා රුපියල් ලක්ෂ පහක හෝ මාස දොළහක කාලසීමාවක් සඳහා රුපියල් දහඅට ලක්ෂයක් ඉක්මවන අවස්ථාවක, ලියාපදිංචි විය යුතු යයි නියම කරනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ ලියාපදිංචි වීමට නියමිත සෑම නිශ්චිත ආයතනයක් විසින් ම, ලියාපදිංචිවීම සඳහා, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට දවස් දහයක් ගතවීමට පෙර කොමසාරිස් ජනරාල්වරයා වෙත, නියමිත ආකෘතිය මගින් වූ අයදුම්පතක් ඉදිරිපත් කළ යුතු ය. :

එසේ වුව ද, මේ පනත යටතේ ලියාපදිංචි වී ඇති, මේ පරිච්ඡේදයේ අර්ථානුකූලව නිශ්චිත ආයතනයක් වන යම් ආයතනයක්, මේ පරිච්ඡේදය යටතේ ලියාපදිංචි ආයතනයක් ලෙස සියලු කාර්ය සඳහා සැලකිය යුතු ය.

(4) එසේ ලියාපදිංචි කරනු ලැබූ විට, ලියාපදිංචි වූ ඒ ආයතනය වෙත, කොමසාරිස් ජනරාල්වරයා විසින්-

(අ) බදු ලියාපදිංචි අංකයක් ; සහ

(ආ) ලියාපදිංචි කිරීමේ සහතිකයක්

නිකුත් කළ යුතු ය. :

එසේ වුව ද, මේ පරිච්ඡේදය යටතේ ලියාපදිංචි කර ඇති ලෙස සැලකෙන යම් ආයතනයකට, බදු ලියාපදිංචි අංකයක් සහ ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කරනු නො ලැබිය යුතු ය.

මාසික බදු අයකළ හැකි කාලසීමාව.

25ආ. සෑම ලියාපදිංචි නිශ්චිත ආයතනයක ම බදු අයකළ හැකි කාලසීමාව එක් මාසයක් විය යුතු අතර, එක් එක් මාසය සඳහා, ඊළග මාසයේ අවසානයට පෙර, නියමිත ආකෘතියෙහි දු වාර්තාවක් සපයනු ලැබිය යුතු ය.

බද්ද ගණන් බැලීම.

25ඇ. (1) මේ පරිච්ඡේදය යටතේ ලියාපදිංචි සෑම නිශ්චිත ආයතනයක් ම, පිළිගත් ගණන ප්‍රමිති අනුව ගණන් බලන ලද ලාභ මත ආදායම් බදු ගෙවීමට ප්‍රථම, අවස්ථාවෝචිත පරිදි, ශුද්ධ ලාභ හෝ පාඩු ඇතුළත් වන ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයක් මගින් ආර්ථිකයේ යහපත සැලකිල්ලට ගෙන අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන ආර්ථික ක්ෂය සඳහා ගැලපීමකට යටත් වන සහ ආයතනයේ සියලුම සේවා නියුක්තයන්ට ගෙවිය යුතු පඩිනඩිවල ප්‍රමාණයේ එකතුව ඇතුළත් වන එක් එක් බදු අයකළ හැකි කාලසීමාවක් සඳහා ඒ ආයතනයේ අගය එකතුවේ මුළු ගණන මත බදු ගෙවීමට යටත් විය යුතු ය.

එසේ වුව ද, බදු අය කළ හැකි එක් එක් කාලසීමාව සඳහා නිවැරදි ලාභ මුදල් ප්‍රමාණය නිසැකව දැනගත නොහැකි අවස්ථාවක එම ප්‍රමාණය, ලබාගත හැකි තොරතුරුවල පදනම මත තක්සේරු කරනු ලැබිය හැකි ය. තක්සේරු කරනු ලැබූ ප්‍රමාණය අර්ධ වාර්ෂික පදනමක් මත තථ්‍ය මුදල් ප්‍රමාණ පිලිබිඹු වන පරිදි සකස් කරගත යුතු ය.

සියලුම සේවානියුක්තයන්ට ගෙවන ලද පඩිනඩිවලට–

(අ) 2000 අංක 38 දරන දේශීය ආදායම් පනතේ XIV වන පරිච්ඡේදය යටතේ "නිශ්චිත සේවානියුක්තයන්" සම්බන්ධයෙන් වන විට, ඒ සේවානියුක්තයන්ට ගෙවිය යුතු වූ ද 2000 අංක 38 දරන දේශීය ආදායම් පනතේ 110 වන වගන්තියේ (අ) ඡේදය යටතේ පවත්වාගෙන යන වැටුප් පත්‍රිකාවේ පිළිබිඹු වන්නා වූ ද දළ පඩිනඩි : සහ

(ආ) නිශ්චිත සේවා නියුක්තයකු නොවන සේවා නියුක්තයකු සම්බන්ධයෙන් වන විට, (2) වන උපවගන්තිය යටතේ පවත්වාගෙන යනු ලබන වැටුප් පත්‍රිකාවේ පිළිබිඹු වන ඒ සේවා නියුක්තයාට ගෙවන ලද දළ පඩිනඩි,

ඇතුළත් වේ.

(2) සෑම ලියාපදිංචි නිශ්චිත ආයතනයක් ම විසින්, නිශ්චිත සේවා නියුක්තයකු සම්බන්ධයෙන් හැරෙන්නට, සෑම සේවා නියුක්තයකු ම සම්බන්ධයෙන්, 2000 අංක 38 දරන දේශීය ආදායම් පනතේ 110 වන වගන්තිය යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් දක්වා ඇති ආකාරයට වූ වැටුප් පත්‍රිකාවක් පවත්වාගෙන යා යුතු ය.

(3) එක් එක් මාසය සඳහා ගෙවිය යුතු බදු මුදල, (1) වන උපවගන්තියේ නිශ්චිතව දැක්වෙන එකතු කළ අගයෙන් සියයට දහයක් විය යුතු ය.

බදු බැර වාසිය.

25ඈ. ලියාපදිංචි යම් ආයතනයක් විසින්, මේ පනතේ මේ පරිච්ඡේදය නොවන වෙනත් යම් විධිවිධානයක් යටතේ යම් බදු මුදලක් ගෙවා ඇති අවස්ථාවක, කොමසාරිස් ජනරාල්වරයාගේ මතය අනුව, මේ පරිච්ඡේදයේ කාර්ය සඳහා ලාභය ගණන් බැලීමට එම ආයතනයේ ලැබීම් සැලකිල්ලට ගැනීම සහ මේ පනතේ වෙනත් යම් විධිවිධානයක් යටතේ බදු අය කළ හැකි සැපයුම් ගණන් බැලීමේ කාර්ය සඳහා එවැනි ආයතනයක ලැබීම් පිළිගැනීමෙහි වැදගත් වෙනසක් නොවන අවස්ථාවක, මේ පරිච්ඡේදය යටතේ ගෙවිය යුතු බදු මුදලින්, එසේ ගෙවන ලද බදු මුදලට සමාන මුදල් ප්‍රමාණයක බැර වාසියකට ඉඩ හැරිය යුතු ය :

එසේ වුවද, 22 වන වගන්තියේ විධිවිධාන සලසා තිබෙන පරිදි සම්මත අනුප්‍රමාණ අනුව ගණන් බලන ලද බදුවලට අදාළව, මේ පරිච්ඡේදය යටතේ

හැර මේ පනතේ වෙනත් යම් විධිවිධානයක් යටතේ ගෙවන ලද බදු මුදලකින් සියයට පනහක් පමණක්, මේ පරිච්ඡේදය යටතේ ගෙවිය යුතු බද්දෙන් අඩු කරනු ලැබිය යුතු ය.

මේ පරිච්ඡේදය යටතේ ලියාපදිංචි ආයතනවලට IV සිට XVI දක්වා පරිච්ඡේද අදාළ වන බව.

25ඉ. මේ පරිච්ඡේදය යටතේ අයකරන බදුවලට (IV) සිට (XVI) දක්වා පරිච්ඡේදවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ වන්නේ ය.

අර්ථ නිරූපණය.

25ඊ. මේ පරිච්ඡේදයේ කාර්ය සඳහා–

"මූල්‍ය සේවා සැපයුම" යන්නෙන්–

(අ) යම් ජංගම, තැන්පතු හෝ ඉතිරි කිරීමේ ගිණුමක් ක්‍රියාත්මක කිරීම ;

(ආ) ව්‍යවහාර මුදල් හුවමාරු කිරීම ;

(ඇ) නෝට්ටුවක්, ගෙවීම් නියෝගයක්, චෙක්පතක් හෝ ණයවර ලිපියක් නිකුත් කිරීම, ඒ සඳහා මුදල් ගෙවීම, එකතු කිරීම හෝ ඒවායේ අයිතිය පැවරීම ;

(ඈ) යම් තැනැත්තකු විසින් ණය වී ඇති මුදල ගෙවීමට ඇති යම් අයිතිවාසිකමක් හෝ යම් හිමිකමක් ඇත්තා වූ යම් ණය සුරැකුම්පතක් නිකුත් කිරීම, වෙන් කිරීම, අයිතිය පැවරීම, අණ කිරීම, ප්‍රතිග්‍රහණය හෝ පිටසන් කිරීම ;

(ඉ) යම් සම කොටස් සුරැකුම්පත් හෝ සහභාගි සුරැකුම්පතක් නිකුත් කිරීම, වෙන් කිරීම හෝ අයිතිය පැවරීම ;

(ඊ) සම කොටස් සුරැකුම්පතක්, ණය සුරැකුම්පතක් හෝ සහභාගි සුරැකුම්පතක් නිකුත් කිරීම, ප්‍රාරක්ෂණය කිරීම හෝ උප ප්‍රාරක්ෂණය කිරීම ;

(උ) යම් ණය මුදලක්, අත්තිකාරම් මුදලක් හෝ බැරපතක් සැපයීම ;

(ඌ) භාණ්ඩ සැපයුම්ලාභියාට දැනුම් දුන්නා වූ ද, වෙනම වැය බරක් කරනු ලැබුවා වූ ද, පහසුකමක් වන කුලී සින්නක්කර කොන්දේසි සහිත විකිණීමක දී හෝ ණය විකුණුම් ගිවිසුමක දී–

(අ) ගිවිසුමක් වෙනම වැය බරක් කරනු ලැබ තිබෙන පහසුකමක් මත කුලී සින්නක්කර කොන්දේසි සහිත විකිණීමේ ගිවිසුමක දී හෝ ණයට විකිණීමේ චාරික ණය මූල්‍යකරණ පහසුකම සැලසීම ;

(ආ) සපයන ලද භාණ්ඩ, ඒ ගිවිසුමේ දිනය වන විට මාස දොළහකට අඩු නොවන කාලයක් ශ්‍රී ලංකාවේ පාවිච්චි කර තිබෙන විට යම් කුලී සින්නක්කර ගිවිසුමක් හෝ කොන්දේසි සහිත විකිණීමේ ගිවිසුමක් යටතේ එම භාණ්ඩ සැපයුම ;

"නිශ්චිත ආයතනය" යන්නෙන්–

(අ) 1988 අංක 30 දරන බැංකු පනතේ අර්ථානුකූලව බලපත්‍රලත් වාණිජ බැංකුවක් ;

(ආ) 1988 අංක 78 දරන මුදල් සමාගම් පනත යටතේ ලියාපදිංචි මුදල් සමාගමක් ;

(ඇ) 1988 අංක 30 දරන බැංකු පනතේ අර්ථානුකූලව බලපත්‍රලත් විශේෂ බැංකුවක්,

අදහස් වේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය සංශෝධනය කිරීම.

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තියේ එහි (2) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) එම උපවගන්තියේ (ආ) ඡේදයේ "තැනැත්තා විසින් අය කළ හැකි බවට" යන වචන වෙනුවට "තැනැත්තා විසින් අයකර නැති බවට" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එම උපවගන්තියේ අතුරු විධානයෙහි "දිනයේ සිට පැහැර හරින ලද" යන වචන වෙනුවට "දිනයේ සිට පැහැර හරින ලද" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය සංශෝධනය කිරීම.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය, එහි (2) වන උපවගන්තියෙන් ඉක්බිතිව පහත දැක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

"(3) මේ වගන්තිය යටතේ ගෙවිය යුතු යම් දණ්ඩන මුදලක් 2002 නොවැම්බර් 6 වන දිනට අයවිය යුතු ව ඇති අවස්ථාවක–

(අ) පැහැර හැර තිබෙන ගෙවිය යුතු බදු මුදල් 2002 නොවැම්බර් 06 වන දින හෝ ඊට පෙර සම්පූර්ණයෙන් ගෙවා නිම කර ඇති අවස්ථාවක, එම දණ්ඩන මුදල සම්පූර්ණයෙන් අත්හැර දැමිය යුතු ය ;

(ආ) පැහැර හැර තිබෙන ගෙවිය යුතු බදු මුදලින් කොටසක්, 2002 නොවැම්බර් 6 වන දින හෝ ඊට පෙර ගෙවා ඇත්නම් එම දණ්ඩන මුදලින්, ගෙවීම පැහැර හැර ඇති බදු මුදලින් ගෙවා තිබෙන මුදල් ප්‍රමාණයට යොමු කළ හැකි මුදල අත්හැර දැමිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය සංශෝධනය කිරීම.

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය එහි (1) වන උපවගන්තියේ "බදු මුදල වශයෙන් සැලකිය යුතු ය" යන වචනවල සිට එම උපවගන්තියේ අවසානය දක්වා කොටස ඉවත් කර ඊ වෙනුවට"බදු මුදල වශයෙන් සැලකිය යුතු ය" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය සංශෝධනය කිරීම.

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය එහි (2) වන උපවගන්තියේ "තක්සේරුකරුගේ මතය වූ අවස්ථාවක, තක්සේරුකරු විසින් තක්සේරුවක්" යන වචනවල සිට එම උපවගන්තියේ අවසානය දක්වා කොටස ඉවත් කර ඊ වෙනුවට "තක්සේරුකරුගේ මතය වූ අවස්ථාවක තක්සේරුකරු විසින්–

(අ) තක්සේරුවක් කර නැති අවස්ථාවක අදාළ බදු අය කළ හැකි කාලසීමාවේ අවසානයේ සිට අවුරුදු පහක කාලයක් ඇතුළත ; හෝ

(ආ) තක්සේරුවක් කර ඇති අවස්ථාවක, එම තක්සේරුව අදාළ වන බදු අය කළ හැකි කාලසීමාවේ අවසානයේ සිට අවුරුදු පහක කාලසීමාවක් ඇතුළත අතිරේක තක්සේරුවක් කිරීම නීත්‍යානුකූල විය යුතු ය.

මේ පරිච්ඡේදයේ කාර්ය සඳහා, යම් තක්සේරු දැන්වීමක බදු අය කළ හැකි කාලසීමා එකක් හෝ වැඩි ගණනක් පිළිබඳව සඳහන් විය හැකි ය.".යන කොටස ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය, එහි (8) වන උපවගන්තියේ දෙවන අකුරු විධානයේ "අවුරුදු තුනක කාලයක්" යන වචන වෙනුවට "අවුරුදු දෙකක කාලයක්" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය සංශෝධනය කිරීම.

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ලෙස අංක යෙදීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ නැවත අංක යෙදූ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :-

"(2) වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, සමාලෝචන මණ්ඩලය වෙත (1) වන උපවගන්තිය යටතේ කරන අභියාචනයක්, සමාලෝචන මණ්ඩලය විසින් විභාග කිරීම ආරම්භ කළ දිනයේ සිට අවුරුදු දෙකක කාලසීමාවක් ඇතුළත, එම අභියාචන පිළිබඳව මණ්ඩලය තීරණය කළ යුතු ය.".

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වන වගන්තියට ඉක්බිතිව ම මෙහි පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර එය ඒ ප්‍රඥප්තියේ 48අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය :-

ප්‍රධාන ප්‍රඥප්තියේ 48අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

පැහැර හැර ඇති බද්ද අයකර ගත යුතු කාලසීමාව.

48අ. යම් බද්දක් ගෙවීම පැහැර හැරි දිනයේ සිට මාස තුනකට පසුව අවුරුදු පහක් ඉකුත් වී ඇති අවස්ථාවක, මේ පරිච්ඡේදය යටතේ බදු අයකර ගැනීම සඳහා කිසිම නිති කෘත්‍යයක් ආරම්භ කිරීම හෝ වෙනත් නඩු පැවරීමක් කිරීම හෝ බදු අයකර ගැනීම සඳහා පවරන ලද විභාග වීමට තිබෙන යම් නඩුවක නඩු කටයුතු කරගෙන යාම හෝ නොකළ යුතු ය.''.

ප්‍රධාන ප්‍රඥප්තියේ 58 වන වගන්තිය සංශෝධනය කිරීම.

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 58 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ "ලියාපදිංචි තැනැත්තකු විසින්" යන වචනවල සිට "අයකර ගැනීම සඳහා" යන වචන දක්වා කොටස ඉවත් කර ඒ වෙනුවට "ලියාපදිංචි තැනැත්තකු විසින්, බදු අය කළ හැකි කාලසීමාවක් තුළ වැඩිදුර ගෙවා ඇති යම් බදු මුදලක් හෝ දඩ මුදලක් ආපසු අයකර ගැනීම සඳහා ඒ බදු අය කළ හැකි කාලසීමාව අවසානයේ සිට අවුරුදු තුනක් ඇතුළත" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 67 වන වගන්තිය සංශෝධනය කිරීම.

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 67 වන වගන්තිය, ඒ වගන්තියේ (අ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :–

''(අඅ) 25අ වගන්තිය යටතේ නියමිත පරිදි ලියාපදිංචිවීම සඳහා ඉල්ලුම් කිරීම පැහැර හරින්නා වූ ; හෝ''.

ප්‍රධාන ප්‍රඥප්තියේ 75අ යන අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ 75 වන වගන්තියට ඉක්බිතිව ම මෙහි පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර එය ඒ ප්‍රඥප්තියේ 75අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය :–

"ලේකම්වරයා මාර්ගෝපදේශ නිකුත් කළ යුතු බව.

75අ. මේ පනතේ විධිවිධාන නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා මාර්ගෝපදේශ නිකුත් කිරීම යෝග්‍ය යයි අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා සලකන කවර හෝ කාරණයක් වෙනුවෙන් ඔහු විසින් වරින් වර මාර්ගෝපදේශ නිකුත් කරනු ලැබිය හැකි ය.''.

ප්‍රධාන ප්‍රඥප්තියේ 80 වන වගන්තිය සංශෝධනය කිරීම.

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ 80 වන වගන්තිය එහි (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ (ii) වන අනුඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :–

"(ii) 64 වන වගන්තිය යටතේ".

**20.** ප්‍රධාන ප්‍රඥප්තියේ 83 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :- ප්‍රධාන ප්‍රඥප්තියේ 83 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) "නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා" යන යෙදුමේ අර්ථකථනයේ "දේශීය ආදායම් නියෝජ්‍ය අධ්‍යක්ෂවරයකු" යන වචන වෙනුවට "දේශීය ආදායම් නියෝජ්‍ය කොමසාරිස්වරයකු" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) "භාණ්ඩ" යන්නෙහි අර්ථකථනය වෙනුවට පහත දැක්වෙන අර්ථකථනය ආදේශ කිරීමෙන් :-

"භාණ්ඩ" යන්නෙන්, සියලු වර්ගවල චංචල හෝ නිශ්චල දේපළ අදහස් වන නමුත් ඊට-

(අ) මුදල් ;

(ආ) ගනුදෙනුකරුවන්ගේ විශේෂ අවශ්‍යතා පරිදි අසමාන වැඩසටහනක් ලෙස හෝ සම්මත වැඩ සටහන් සඳහා අනුවර්තන, අන්තර් සමාගම් තොරතුරු දත්ත හා ගිණුම්, උද්දිපිත හෝ යාවත්කාලින කළ පවත්නා නිශ්චිත වැඩ සටහන්, මුල් වැඩසටහන මිල දී ගත් ගනුදෙනුකරුවන්ට ගිවිසුමක බැඳීම් යටතේ සපයන උද්දීපිත හා යාවත්කාලීන කළ පවත්නා සාමාන්‍ය වැඩසටහන් හෝ මෘදුකාංගයක අන්තර්ගතයේ අගය වෙනම හඳුනාගත හැකි අවස්ථාවක එම අන්තර්ගතයේ අගය

ඇතුළත් නොවේ;";

(3) "බදු අයකළ හැකි කාලසීමාව" යන යෙදුමේ අර්ථ කථනයෙහි (අ) ඡේදයේ (iv) වන අනුඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :-

"(iv) යම් තැනැත්තකු විසින් ව්‍යාපාරයක් හෝ ව්‍යාපෘතියක් ආරම්භකොට මේ පනතේ 22 වන වගන්තියේ (7) වන උපවගන්තියේ හෝ 1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා

බදු පනතේ 22 වන වගන්තියේ (6) වන උපවගන්තියේ නියමයන්ට අනුකූල වීමට භාරගත් අවස්ථාවක දී :"

ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම.

**21.** ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ උපලේඛනයේ (xi) වන අයිතමයේ (ඌ) ඡේදය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :-

"(ඌ) භාණ්ඩ සැපයුම්ලාභියාට දැනුම් දුන්නා වූ ද, වෙනම වැය බරක් කරනු ලැබුවා වූ ද, පහසුකමක් වන කුලී සින්නක්කර කොන්දේසි සහිත විකිණීමක දී හෝ ණය විකුණුම් ගිවිසුමක දී-

(අ) වෙනම වැය බරක් කරනු ලැබ තිබෙන පහසුකමක් වන කුලී සින්නක්කර කොන්දේසි සහිත විකිණීමේ ගිවිසුමක දී හෝ ණයට විකිණීමේ ගිවිසුමක දී වාරික ණය මූල්‍යකරණ පහසුකම සැපයීම ;

(ආ) සපයන ලද භාණ්ඩ, ඒ ගිවිසුමේ දිනය වන විට මාස දොළහකට අඩු නොවන කාලයක් ශ්‍රී ලංකාවේ පාවිච්චි කර තිබෙන විට යම් කුලී සින්නක්කර ගිවිසුමක් හෝ කොන්දේසි සහිත විකිණීමේ ගිවිසුමක් යටතේ එම භාණ්ඩ සැපයීම.".

(2) එහි (xiii) වන අයිතමයේ "භාණ්ඩ ආනයනය කිරීම හෝ එම භාණ්ඩ සැපයීම" යන වචන වෙනුවට "භාණ්ඩ ආනයනය කිරීම සහ එම භාණ්ඩ සැපයීම" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) එහි (xiv) වන අයිතමයේ "තැපැල් ආදායම් මුද්දර ආනයනය කිරීම හෝ සැපයුම" යන වචන වෙනුවට "තැපැල් සහ ආදායම් මුද්දර ආනයනය කිරීම හෝ සැපයුම" යන වචන ආදේශ කිරීමෙන් ;

(4) ඒ උපලේඛනයේ (xvi) වන අයිතමය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන් :-

"(xvi) අමාත්‍යවරයා සෑහීමට පත් වී ඔහු විසින් අනුමත කරන ලද භාණ්ඩ, යම් සංවිධානයක් විසින් ස්වභාවික හෝ මිනිස් ව්‍යසන නිසා ඇති වූ හදිසි ආපදාවලට සහන සැලසීම සඳහා පිටරට තැනැත්තන්ගෙන් හා සංවිධානවලින් තෑගි වශයෙන් ලැබී ආනයනය කිරීම හෝ විදේශ සංවිධානවල අරමුදලින් එම කාර්ය සඳහා භාණ්ඩ සැපයීම;";

(5) එහි (xxvi) අයිතමය ඉවත් කිරීමෙන්.

**22.** ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :- ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය සංශෝධනය කිරීම.

(1) එහි (ix) වන අයිතමයේ "රතිල ඇට වර්ග" යන වචන වෙනුවට "පරිප්පු" යන වචනය ආදේශ කිරීමෙන් ;

(2) එහි (xii) වන අයිතමයේ "පැට්‍රෝල්, ඩීසල් සහ ද්‍රවිකෘත පෙට්‍රෝලියම් ගෑස්" යන වචන වෙනුවට "පැට්‍රෝල්, ඩීසල් සහ ද්‍රවිකෘත පෙට්‍රෝලියම් ගෑස්" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) ඒ උපලේඛනයේ (xviii) වන අයිතමය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන් :-

"(xviii) කල්බදු දීමට යන වත්කම වෙනුවෙන් හෝ ඒ කල්බදු ගණුදෙනුව හා සම්බන්ධව හෝ ලැබෙන යම් අත්තිකාරම් ගෙවීමක් හෝ කල්බදු ගිවිසුම යටතේ ගෙවිය යුතු මුදල් කල්මත්තෙන් ගෙවා බේරුම් කිරීම පිණිස කරනු ලබන, සම්පූර්ණ ගිවිසුම්ගත අගයෙන් සියයට දහයක් ඉක්මවන යම් ගෙවීමක් නොවන 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනත යටතේ ලියාපදිංචි තැනැත්තකු විසින් කල්බදු මූල්‍යකරණ පහසුකම් සැපයුම ;";

(4) ඒ උපලේඛනයේ (xxi) අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අයිතම එකතු කිරීමෙන් :-

"(xxii) ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශයේ ලියාපදිංචි වෘත්තිය සම්මේලන සංවිධානයක් විසින් සම්මන්ත්‍රණ හෝ වෙනත් වැදගත් සිදුවීම් සංවිධානයේ දී සේවා සැපයීම ;

(xxiii) රෙදිපිළි සහ අත්යන්ත්‍ර රෙදි නිෂ්පාදන සැපයීම හෝ ආනයනය ;

(xxiv) නැව් සැපයීම හෝ ආනයනය ;

(xxv) යම් ස්වර්ණාභරණ සැපයීම හෝ ආනයනය ;

(xxvi) බඩ ඉරිඟු සැපයීම හෝ ආනයනය ;

(xxvii) යන්ත්‍රෝපකරණ, වෛද්‍ය හා ශල්‍ය වෛද්‍ය සහ සෞඛ්‍ය සේවා පවත්වාගෙන යාම සඳහා වෛද්‍ය හා දන්ත වෛද්‍ය උපකරණ සහ ගිලන් රථ ද ඇතුළු ආම්පන්න හා උපාංග සැපයුම හෝ ආනයනය ;

(xxviii) පළමුවන උපලේඛනයේ නිශ්චයකොට දැක්වෙන සැපයුම් හැර, නේවාසික ඉඩ පහසුකම් සැපයීම, බද්දට හෝ කුලියට දීම:

(xxix) පළමුවන උපලේඛනයේ නිශ්චයකොට දැක්වෙන සැපයුම් හැර, වෛද්‍ය ආයතන විසින් සපයනු ලබන සෞඛ්‍ය ආරක්ෂක සේවා සැපයීම ;

(xxx) ඉඩම් සහ වැඩිදියුණු කිරීම් සැපයීම.".

අතීතයට බලපෑම.

**23.** (1) 2 වන වගන්තියට කරන ලද සංශෝධනය. අලුත් IIIඅ පරිච්ඡේදය ඇතුළත් කිරීම 33, 34 සහ 35 වන වගන්තිවලට කරන ලද සංශෝධන සහ 48අ වගන්තිය ඇතුළත් කිරීම, 58 වන වගන්තියට කරන ලද සංශෝධනය, 75අ වන වගන්තිය ඇතුළත් කිරීම, සහ ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනයට මේ පනතේ 2, 8, 12, 13, 14, 15, 16, 17, 22(3) සහ 22(4) යන වගන්තිවලින් කරනු ලබන සංශෝධන 2003 ජනවාරි 1 වන දින සිට බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

(2) ප්‍රධාන ප්‍රඥප්තියේ 11, 14, 20, 21, 22, 26, 28, 80, 83 යන වගන්තිවලට, ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනයට සහ දෙවන උපලේඛනයට මේ පනතේ 3, 4, 5, 6, 7, 9, 11, 19, 19(1) 21, 22(1) සහ 22(2) යන වගන්තිවලින් කරනු ලබන සංශෝධන,

2002 අගෝස්තු 1 වන දින සිට බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සැලකිය යුතු ය.

(3) ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තියට මේ පනතේ 10 වන වගන්තියෙන් කරනු ලබන සංශෝධන, 2002 නොවැම්බර් 06 වන දින සිට බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

**24.** 2003 ජනවාරි 1 දිනයෙන් ආරම්භව මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවීම දක්වා යම් තැනැත්තකු විසින් මේ පනතේ විධිවිධාන සලසා තිබෙන පරිදි බදු එකතු කර ගන්නේ ද ඒ තැනැත්තා නිසි බලය ඇතිව ක්‍රියා කළ සේ සැලකිය යුතුවාක් මෙන්ම එම බදු එකතුකර ගැනීම වලංගු ආකාරයෙන් කරනු ලැබ ඇති හා කරන ලද ලෙස සියලු කාර්ය සඳහා සැලකිය යුතු අතර, එසේ බදු එකතු කිරීම හා සම්බන්ධ සියලු සිවිල් හෝ අපරාධ නඩුවලට එරෙහිව මෙයින් වගකීමෙන් ආරක්ෂා කරනු ලැබේ.

වලංගු කිරීම.

**25.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.